ගරු විපක්ෂ නායකතුමනි,

## 13වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කරන බවට පොරොන්දුවීම මගින් අපගේ ආදරනීය මව්බිම බෙදුම්වාදයේ ගොදුරක් බවට පත් කිරීමේ අනතුර පිළිබඳව

මීට පෙර කිසිදු විපක්ෂ නායකවරයෙකු නොකළ ආකාරයට උතුරු ප්‍රදේශයේ ජනතාව අමතමින් 13වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කරන බවට ඔබතුමා විසින් ස්ථිරසාර සහ විවෘත ප්‍රකාශයක් සිදු කර ඇත. ඔබතුමාට පෙර එම ධුරය දැරූ පුද්ගලයින්ට ද ඔබට මෙන්ම බාහිරින් ඒ සඳහා පීඩනයක් එල්ල වුවද ඔවුන් විසින් එය විවෘතව ප්‍රකාශ නොකළේ ඊට එරෙහිව ප්‍රබල ජනමතයක් පැවතීම නිසා බව ඉතා පැහැදිලිය. නමුත් මේ වන විට රටේ පවතින ආපදා තත්ත්වය තුළ එම විරෝධය ප්‍රබල ලෙස මතු නොවනු ඇතැයි ඔබ විසින් උපකල්පනය කරන බව අපට උපකල්පනය කළ හැක. කෙසේ වෙතත් ඔබතුමා විසින් එවැනි ප්‍රකාශයක් කරනු ලබන්නේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගේ ඡන්ද ඉලක්ක කරමින් බව ඉතා පැහැදිලිය. ඊට හේතුව ඔබතුමා විසින් මීට පෙර පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස 22 වැනි ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීවරයාගේ ඉල්ලීම පරිදි එම සංශෝධනයට 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සඳහා වන වගන්ති 2ක් ඇතුල් කළ බව හෙළිදරව් වීමය.

ඔබතුමාගේ පියා 1987 දී ඉන්දු ලංකා ගිවිසුමට අකමැත්ත ප්‍රකාශ කළද පසුව 13 වැනි සංශෝධනයට පක්ෂව අත ඔසවනු ලැබුවේය. නමුත් ඔහු කිසිදු අවස්ථාවක 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කරන බවට ප්‍රකාශ නොකළ අතර ජනාධිපතිවරයෙකු ලෙස ඒ සඳහා උත්සාහ කිරීමට ද කටයුතු නොකළේය. ඔබ විසින් පටු දේශපාලන උවමනාවන් සඳහා ප්‍රකාශ නිකුත් කිරීමට පෙර 13 වැනි සංශෝධනයේ ඉතිහාසය විමසා බැලීම වැදගත් වන්නේ එහි බරපතලකම සහ එම සංශෝධනයේ සැබෑ වුවමනාව කුමක්දැයි තේරුම් ගැනීම සඳහාය. එම ඉතිහාසය ආරම්භ වන්නේ 1932 දී ඉන්දියාවේ සර්දාර් පනික්කාර් න්‍යාය අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍යය දුර්වල කර ගිවිසුම් මගින් අර්ධ යටත් විජිතයක් බවට පත් කර ගත යුතුය යන න්‍යායාත්මක ප්‍රවේශය මතය. ඒ අනුව එදා 1987 දී ඔවුන්ගේ අරමුණ වූයේ බෙදී වෙන් වන ඊලාම් රාජ්‍යය අර්ධ යටත් විජිතයක් ලෙද ඇඳෑ ගැනීමය. නමුත් අද වන විට පවතින ආපදා තත්ත්වය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියාවේ ආර්ථිකය සමග ඒකාබද්ධ කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්වී 13 වැනි සංශෝධනය බලාත්මක කිරීමෙන් පසුව 30වැනි ප්‍රාන්තය ද බිහිවීමේ හැකියාව ඇත. ඒ අනුව 13 වැනි සංශෝධනයේ අවසන් ප්‍රතිඵල අවබෝධකර ගත යුත්තේ ඉන්දු-ඇමෙරිකානු දීර්ඝකාලීන භූ දේශපාලන උවමනාවන්ට සාපේක්ෂව බව ඔබ විසින් තේරුම්ගත යුතුය.

එදා ඉන්දු - ඇමෙරිකානු කළ භූ දේශපාලන උවමනාවට අනුව බෙදුම්වාදී ගැටුම් වර්ධනය කිරීම සඳහා බාහිර බලවේග දායක වූ බව සහ එය යොදා ගනිමින් ඉන්දු- ලංකා ගිවිසුම අත්සන් කිරීමට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට බලපෑම් කළ බව දැන් රහසක් නොවේ. එසේ වුවත් එතුමා විසින් රට බෙදීම වැළැක්වීම සඳහා ඉන්දියානු නිලධාරීන් සමඟ කේවල් කර 13වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම වැළැක්වීම සඳහා යම් ව්‍යවස්ථාමය බාධක ප්‍රමාණයක් පනවා ඇති බව හිටපු අගවිනිසුරු රාජා වනසුන්දර මහතා විසින් හෙළිදරව් කරනු ලැබීය. එසේ කිරීම මගින් අදාළ සංශෝධනය ජනමත විචාරණයකට ඉදිරිපත් කිරීමට සිදු නොවන ආකාරයට සම්මත කරගැනීම ඉන්දියාවේ අපේක්ෂාව වූ බව පිළිගත හැක. එදා ඉන්දු - ලංකා ගිවිසුමට සහ 13වැනි සංශෝධනයට එරෙහිව පැවති ප්‍රබල විරෝධය නිසා එම සංශෝධනය ජනමත විචාරණයක් මගින් සම්මත කළ නොහැකි බව පැහැදිලි කරුණකි.

එම විනිසුරුතුමා 13වැනි සංශෝධනයට එරෙහි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම් විභාග කළ විනිසුරු මඩුල්ල ද නියෝජනය කරනු ලැබීය. එතුමාට අනුව 13වැනි සංශෝධනය යනු ජාතියේ හිසට ඉහළින් එල්ලා ඇති භයානක කඩු තුඩකි. ඔහුට අනුව එය ගැට ගසා ඇත්තේ ඊට එරෙහිව පවතින ව්‍යවස්ථාමය බාධක නම් වූ ඉතා දුර්වල රැහැන් පට වලිනි. ඒ නිසා ඔහු අප රටේ මහා සංඝරත්නය ප්‍රමුඛ ජාතික බලවේග වලින් ඉල්ලා සිටියේ ව්‍යවස්ථා සංශෝධනයක් මගින් හෝ පරිපාලන ක්‍රියාමාර්ග මගින් එම රැහැන් පට කපා දැමීමට දිවිහිමියෙන් ඉඩ නොදෙන ලෙස ය. ඒ

අනුව ඔහු අවධාරණය කළේ නව ව්‍යවස්ථාවක් මගින් ''කඩුව'' ඉවත් කරන තෙක් රැහැන කැපීම හෙවත් බාධක ඉවත් කිරීම මගින් 13වැනි  සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම කිසිසේත්ම නොකළ යුතු බරපතළ වරදක් බවය.

නමුත් පවතින දේශපාලන තත්වය සහ විදේශීය බලපෑම් නිසා 13වැනි සංශෝධනය පමණක් විශේෂිතව ඉවත් කිරීමද යථාර්ථයක් නොවන බවට අපට විවාදයක් නැත. එසේ නම් කළ යුත්තේ 13 වැනි සංශෝධනයක් නොමැති නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම සහ ඒ මගින් බෙදුම්වාදයෙන් රට ගලවා ගන්නා අතර විධායක බලය උපරිම ලෙස විමධ්‍යගත කිරීමය. එසේම සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සමාන අයිතිවාසිකම් තහවුරු කෙරෙන බව එම නව ව්‍යවස්ථාව මගින් සහතික කිරීමය. නමුත් ඔබතුමා විසින් බලය ලබාගැනීමේ පටු උවමනාව සඳහා ලබාදෙන පොරොන්දු නිසා ඔබතුමා බලයට පත්වුවද එම නිවැරදි ක්‍රියාමාර්ගය තේරීමට කිසිදු ඉඩක් නොලැබෙන බව ඉතා පැහැදිලිය.

ඒ ආකාරයට අනතුරුදායක දේශපාලන පොරොන්දු ලබාදෙමින් සුළුජන ඡන්ද පදනම ශක්තිමත් කර ගැනීම මගින් ඔබතුමා බලයට පත්වුවහොත් අනිවාර්යෙන්ම නව ව්‍යවස්ථාවක් වෙනුවට පවතින ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කිරීමට සිදුවනු ඇත.  එසේ ජනාධිපති පුටුවේ අසුන්ගැනීමට ඔබතුමාට හැකිවුවහොත් ඔබතුමා විසින් සිදුකිරීමට නියමිත මහා අකුසල කර්මයේ විපාක සංක්ෂිප්තව අවධාරණය කිරීම අපගේ යුතුකමක් සහ වගකීමක් ලෙස සලකමු. ඊට අමතරව ඔබතුමා විසින් බෙදුම්වාදී උවමනාවන් පාසල් දරුවන්ගේ මනසට කාවැද්දීමට උත්සාහ දැරීම මගින් එම විපාක තවදුරටත් වර්ධනය වන බවද කිව යුතුය. ඒ අනුව පහත සඳහන් කරුණු ඉතා බරපතළ ලෙස සැලකිල්ලට ගන්නා ලෙස කරුණාවෙන් දැනුම් දෙමු.

1. 13 වැනි සංශෝධනයට එරෙහිව පනවා ඇති ව්‍යවස්ථා බාධක ව්‍යවස්ථා සංශෝධනයක් මගින් ඉවත් කළ යුත්තේ එම සංශෝධනය පරිපාලන වශයෙන් ක්‍රියාත්මක කිරීමට අකමැති ජනාධිපතිවරයෙකු බලයේ සිටින තත්වයක් යටතේය. නමුත් ඉහත සඳහන් කළ ආකාරයට ඔබතුමා බලයට පත්වුවහොත් පරිපාලන වශයෙන් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට සූදානම් බව පැවසීම මගින් ඔබතුමා විසින් රටේ ජනතාවට පෙන්වනු ලබන්නේ තමා බෙදුම්වාදීන්ගේ ඉල්ලීම ඉටු කිරීම සඳහා ස්වකැමැත්තෙන්ම ඉදිරිපත්වන බවය. ඒ මගින් ඔබතුමාට ඉදිරි ජනාධිපතිවරණය දී බෙදුම්වාදයට පක්ෂපාතී යම් ප්‍රතිශතයක ඡන්ද ලබා ගත හැකි වුවත් ඊට එරෙහිවන විශේෂයෙන්ම බහුතර සිංහල බෞද්ධ ජනතාවගේ ආශිර්වාදය ලබා ගැනීමට නොහැකිවනු ඇත.

2. ඔබ සඳහන් කරන ආකාරයට ඔබට බලයට පත්වීමට හැකිවුවහොත් පළාත් සභා මැතිවරණය පවත්වා (ඒ සඳහා දැනටමත් ඉන්දියාව ප්‍රමුඛ ජාත්‍යන්තර බලවේග විසින් බලපෑම් එල්ල කරන බව රහසක් නොවේ.) බෙදුම්වාදයට පක්ෂපාතී හෝ මහ ඇමතිවරයාට ස්වකැමැත්තෙන් යටත්වන වන ආණ්ඩුකාරවරයෙකු උතුරු සහ නැගෙනහිර පළාත්වලට පත්කළහොත් 13වැනි  සංශෝධනය පරිපාලන වශයෙන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීම ආරම්භ වේ. ඒ අනුව කෙටි කාලයකදී එම පළාත්වල ඉඩම් ප්‍රඥප්ති, පොලිස් ප්‍රඥප්ති, මහ ඇමති අරමුදල් ප්‍රඥප්තිය ආදිය සම්මත කිරීම මගින් පූර්ණ පෙඩරල් රාජ්‍යයක් ලෙස කටයුතු කිරීමේ තත්ත්වය ආරම්භ වනු ඇත. එහි ප්‍රතිඵල උතුරු නැගෙනහිර පමණක් නොව දකුණේ ජනතාවට ද පැහැදිලිව දැකගත හැකි වන අතර ඉතා කෙටිකලකදී ඔබතුමා ඊට අදාලව පළමු වගඋත්තරකරුවා බවට මහජනයා විසින් නම් කරනු ඇත.

3. එසේ ප්‍රඥප්ති සම්මත කරමින් මධ්‍යම ආණ්ඩුව සමඟ ප්‍රතිවිරෝධතා ඇතිකර ගන්නා අවස්ථාවේ දී ජනාධිපතිවරයා ලෙස ඔබතුමාට අසරණව බලා සිටීමට සිදුවනු ඇත. ඊට හේතුව එවැනි අවස්ථාවක මධ්‍යම රජය ඊට එරෙහි වුවහොත් ජාත්‍යන්තර මැදිහත්වීමකට අවස්ථාව නිර්මාණය වීමය. එවැනි තත්ත්වයක දී අදාළ පළාත් සභාවට හෙවත් අදාළ ප්‍රදේශයේ පරමාධිපත්‍ය හිමි ජනතාවට බෙදී වෙන්වීමේ අයිතිය ඇති බවට ජාත්‍යන්තර අධිකරණය විසින් නඩු තීන්දුවක් ලබා දී ඇත. පරමාධිපත්‍ය බෙදී යන ආකාරයට බලය බෙදා ඇති විටෙක එනම් මධ්‍යම රජය එම ජනතාවට තම පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදෙන අවස්ථාවක එම ජනතාවට වෙන්වීමේ අයිතිය ඇති බවට නැගෙනහිර ටිමෝරය බෙදා වෙන් කිරීමට අදාළ ඕස්ට්‍රේලියාවට එරෙහිව ජාත්‍යන්තර අධිකරණය නඩු තීන්දුව මගින් ප්‍රකාශයට පත් වී ඇත. එම තත්ත්වය ඇතිවන විට ඔබතුමා බලයේ සිටියද නොසිටියද මහජන ඇස් ඉදිරියේ ඔබතුමා චූදිතයා බවට පත්වනු ඇත.

4. ඔබතුමාගේ නිහඬතාවය ප්‍රයෝජනයට ගනිමින් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් නව නීතියක් මගින් පත් කිරීමට නියමිත සත්‍ය සේවීමේ කොමිසමට ප්‍රතිසංධාන ක්‍රියාවලිය ද අයත් වන බැවින් අනාගත ගැටුම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ද, එනම් බලය බෙදීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ සහ නිර්දේශ ලබා දීම සඳහා බලයක් එම කොමිසමට ලැබේ. ඒ අනුව ඉහත සඳහන් කළ ජාත්‍යන්තර මැදිහත්වීම තවදුරටත් බලවත් කිරීම සඳහා එම කොමිසම යොදා ගැනීමේ හැකියාවද ලැබේ. ඊට අමතරව එම කොමිසම මගින් තෝරාගත් හමුදා නිලධාරීන් පිරිසක් පාවා දීම සඳහා පාපොච්චාරණ ක්‍රියාවලියක් ද දියත් විය හැක. එවිට හමුදාව පාවා දීමේ වරද සමග ඔබතුමාට එරෙහිව එල්ල වන චෝදනා වඩා බරපතළ වනු ඇත.

5. වර්තමාන ව්‍යවස්ථාවේ ඒකීය වගන්තිය පෙන්වා බලය බෙදීම මගින් ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය වීම හෝ රට බෙදීමක් සිදු නොවන බව තහවුරු කිරීමට උත්සාහ කළ ද එය බොරුවක් බව කෙටිකලකින් ඔප්පු වන බවට කිසිදු සැකයක් නැත. ඊට හේතුව සේනාධිරාජාට එරෙහිව චන්ද්‍රසෝම නඩු තීන්දු අනුව ව්‍යවස්ථාවේ ඒකීය වචනය එසේම තිබියදී පෙඩරල් රාජ්‍යයක් පැවතිය හැකි වීමය. ඒකීය වචනය මගින් ඒකීයභාවය තහවුරු නොවන බව එමගින් පැහැදිලි වේ. ඒ අනුව අවසානයේ දී පළමුව තමාම රවටා ගැනීම සහ දෙවනුව පොදු මහජනතාව රැවටීමේ පාපය ඔබතුමාට භාර ගැනීමට සිදුවනු ඇත.

6. දේශීය සහ විදේශීය බෙදුම්වාදී බලවේග වල අරමුණු, ප්‍රකාශ සහ ක්‍රියාමාර්ග අනුව ෆෙඩරල් රාජ්‍යය ජාත්‍යන්තර මැදිහත්වීම මත වෙනම රාජ්‍යයක් බවට පත් කෙරෙන බවට කිසිදු සැකයක් නැත. එය වැළැක්වීම සඳහා ඔබතුමාට කිසිදු ව්‍යවස්ථාමය බලයක් නැති බව ඉතා කෙටිකලකින් ඔබතුමා වටහා ගන්නවා ඇත. එවැනි තත්ත්වයක දී දැනටමත් පශ්චාත් ගැටුම් මානසික පීඩනයට සහ ආර්ථික පීඩනයට මෙන්ම කුල පීඩනයට ද ගොදුරුව සිටින 65% අධික උතුරේ සහ නැගෙනහිර දෙමළ ජනතාවගේ සාපය ද ඔබතුමන්ට එරෙහිව එල්ලවීම වැළැක්විය නොහැක. එම ජනතාවගේ දුකට මුල් වූ දේශපාලන නායකයින්ට පොලිස් බලය ලබා දීමෙන් එම ජනතාව තවදුරටත් පීඩාවට ලක්වන බවට සැකයක් නැත.

7. වෙනම රාජ්‍යයක් බිහි වීමෙන් පසුව එම රාජ්‍යයේ අහිංසක ජනතාව පීඩනයට ලක් වීමට අමතරව නව ගැටුම් නිර්මාණය වීම නිසා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව එකිනෙකා මරාගන්නා මහා ගැටුමකට තල්ලු වීම වැලැක්විය නොහැක. සුඩානයේ ජනතාව මේ මොහොතේ දී එම ඛේදවාචකයට මුහුණ දී සිටින බව ඔබතුමා විසින් ඉතා හොඳින් දන්නා කරුණකි.

8. එම ගැටුම් තුළ ශ්‍රී ලංකාව නම් වූ රාජ්‍යය මහා බලවතුන්ගේ භූ දේශපාලන උවමනාවන් සඳහා ගොදුරු කර ගැනීමේ අවස්ථාව නිර්මාණය වීම නිසා රටේ සමස්ත ජනතාව දාස රාජ්‍යයක යටත් වැසියන් බවට පත්විය හැක. එය අතිශයෝක්තියකින් කරුණු හුවා දැක්වීමක් නොවන බව ජාත්‍යන්තර අත්දැකීම් අනුව වටහා ගත හැක. එවැනි තත්වයකදී ඉතිහාසය විසින් ඔබතුමා ඇතුළු සියළු චූදිතයන් විනිශ්චයට ලක් කෙරුණු ඇත.

9. ඔබතුමා විසින් ගොඩනගනු ලබන දේශපාලන සන්ධානයේ සාමාජිකයින් මත ඔබගේ දේශපාලන මතවාදය සහ දෙමළ ජනතාවගේ ඡන්ද දිනා ගැනීම සඳහා යොදාගන්නා උපක්‍රම පැටවීම මගින් චූදිතයින්ගේ සංඛ්‍යාව වැඩිවීමක් මිස ඔබතුමාට නිර්දෝෂීවීමට හැකියවක් ලැබෙන්නේ නැත.

10. අවසානයේ දී ඉන්දු - ඇමෙරිකානු භූ දේශපාලන උවමනාවන්ට අනුව ඊළාම් රාජ්‍යය, ආසියාවේ ඊශ්‍රායලය ලෙස ත්‍රස්තවාදී රාජ්‍යයක් බවට පරිවර්ථනය කිරීම තුළ ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශ එනම් බොහෝවිට ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය ආසියාවේ ගාසා තීරය බවට පත්වන බවට සැකයක් නැත. එම සමස්ත ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාව නම් වූ රාජ්‍යයේ ඉතිහාසය අවසාන විය හැකි අතර ඒ සමගම සම්බුද්ධ ශාසනය ද ඉතා කෙටි කලකින් අවසන් වනු ඇත. සම්බුද්ධ ශාසනය යනු මනව සංහතිය සුවපත් කරන ඖෂධය හෙවත් කසායනම් ශ්‍රී ලංකාව නම් වූ සුවිශේෂී සභ්‍යත්ව රාජ්‍යය එම කසාය ආරක්ෂා කරන සහ ගබඩා කර තබාගන්නා මංජුසාව ලෙස සැළකිය හැක. ඒ අනුව ගෝලීය මට්ටමින් සිදුවන ඒ මහා ඓතිහාසික පාප කර්මයේ මහා විපාකය කුමක්දැයි අපට අද තීරණය කළ නොහැක.

අවසාන වශයෙන් රටේ අනාගත ඉරණම තීන්දු කිරීමට අදාල වැදගත්ම සහ ප්‍රභල ප්‍රතිපත්තිමය කරුණක් පිළිබඳව එනම් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට අදාලව විපක්ෂ නායක ලෙස  ඔබතුමාගේ මතය සහ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ මතය අතර කිසිදු වෙනසක් හෝ ගැටුමක් නොමැති බව ඉතා පැහැදිළිය. එසේ නම් ඔබ දෙපළ අතුරින් කුමන පුද්ගලයෙකු විසින් ජනාධිපතිධුරය අත්පත්කර ගත්තද ඉහත දැක්වූ රටේ ඉරණම වෙනස් නොවන බවද ඉතා පැහැදිළිය. ඒ අනුව ඔබ දෙපළ පොදුජන පෙරමුණ සමඟ සන්ධානගතව හෝ එසේ නොමැතිව රටේ දේශපාලන බලය ලබාගැනීම යනු රටේ ඉතිහාසය අවසන් කිරීමේ ආරම්භය බව මෙසේ ලියා තබමු.

මේ  වගට

(ජාතික සංවිධාන 59ක් අත්සන් තබා ඇත)